# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## Police Media Division

තැ.පෙ. අංකය / த.பெ.இ / P.O.Box No — 517

ෆැක්ස් / தொலை நகல் / Fax — 011-2329500

දුරකථනය / தொலைபேசி / Telephone — 011-2384024, 011-2395605

වෙබ් ලිපිනය / இணைய தளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E mail — dir.media@police.lk


මගේ අංකය / எனது இல / My No — 897 / 2022

ඔබේ අංකය / உமது இல / Your No —

දිනය / திகதி / Date — 2022.06.17, පැය 2140

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**විරෝධතා සිදු කරමින් කලහකාරී හා ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරුනු පුද්ගලයන් සැකකරුවන් ලෙස නම් කිරීම සහ ඒ පිළිබඳව ගරු අධිකරණයට කරුණු වාර්තා කිරීම.**

2022.06.09 වන දින කොටුව පොලිස් බල ප්‍රදේශයේ මාර්ග වල සහ පොලිස් මූලස්ථානය ඉදිරිපිට විරෝධතා දක්වමින් කලහකාරි ලෙස හැසිරෙමින් සහ 2022.06.10 වන දින තලංගම පොලිස් වසමේ පැලවත්ත ප්‍රදේශයේ විරෝධතාවල යෙදෙමින්, ඉසුරුපාය ඉදිරිපිට ප්‍රචණ්ඩකාරි ලෙස හැසිරෙන අතරතුර රජයේ දේපලවලට අලාභ හානි සිදු කරමින් කටයුතු කළ විරෝධතා කරුවන්ගෙන් පිරිසක් පිළිබඳ කොටුව සහ තලංගම පොලිස් ස්ථාන විසින් කොටුව සහ කඩුවෙල ගරු මහේස්ත්‍රාත් අධිකරණ වෙත ඉදිරිපත් කරන ලද බී වාර්තා මගින් හඳුනාගත් සැකකරුවන් ලෙස නම් කර ඒ පිළිබඳව කරුණු වාර්තා කර ඇත.

මෙම සැකකරුවන් 2022.06.09 සහ 2022.06.10 දෙදින තුළ කොටුව සහ තලංගම යන පොලිස් බල ප්‍රදේශවල විරෝධතාවයේ යෙදෙමින් කලහකාරී සහ ප්‍රචන්ඩකාරී ලෙස ක්‍රියා කර ඇති බවට පොලිස් පරීක්ෂණ වලදී පෙනී ගොස් ඇති බව වාර්තා කර ඇත. ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ සඳහන් වැරදි වන නීති විරෝධී රැස්වීමක සාමාජිකයින් වෙමින්, පොලිස් නිලධාරීන්ගේ රාජකාරියට බාධා කිරීම, සාපරාධී බලහත්කාරය පෑම, තුවාල සිදු කිරීම, අයුතු අවහිර කිරීම, අනර්ථය සිදු කිරීම මෙන්ම පොදු දේපළ විෂයෙහිලා සිදු කරන වැරදි සිදු කිරීම, මංමාවත් පනත යටතේ සිදු කරන වැරදි සිදු කිරීම වැනි වැරදි රාශියක් මෙම සැකකරුවන් සිදුකර ඇති බව නිරීක්ෂණය කර ඇති අතර ඒ තුළින් ඔවුන් මෙම සිදු වූ සිදුවීම් සම්බන්ධයෙන් හඳුනාගත් සැකකරුවන් බවට නම් කර ගරු අධිකරණයට කරුණු වාර්තා කර ඇත.

**සැකකරුවන් ලෙස නම් කරන ලද පුද්ගලයන් පහත පරිදි වේ.**

1. වසන්ත මුදලිගේ - මෙම සැකකරු කොටුව පොලිස් වසමේ 2022.06.09 සිදු

කරන ලද විරෝධතාවයට සම්බන්ධ වූ සැකකරුවෙකු ලෙස නම් කර ඇති අතර 2022.06.10 දින තලංගම පොලිස් වසමේ සිදු කරනලද විරෝධතා සම්බන්ධව හඳුනාගත් සැකකරුවෙකු ලෙස කරුණු වාර්තා කර ඇත.

2. ලහිරු චතුරංග වීරසේකර
3. රතිඳු සේනාරත්න නොහොත් රැට්ටා
4. ජගත් මණුවර්ණ
5. ධම්මික මුණසිංහ
6. රත්කරව්වේ ජිනරතන හිමි
7. එරංග ගුණසේකර
8. ජෙහාන් අප්පුහාමි
9. ගල්වැව සිරිධම්ම හිමි

මෙම සැකකරුවන් 2022.06.09 වන දින කොටුව පොලිස් වසමේ මාර්ගවල සහ පොලිස් මූලස්ථානය ඉදිරිපිට සිදුකරන ලද විරෝධතා සම්බන්ධයෙන් සැකකරුවන් ලෙස නම් කර කරුණු වාර්තා කර ඇත.

කොටුව ගරු මහේස්ත්‍රාත් අධිකරණය මගින් සැකකරුවන් අත්අඩංගුවට ගෙන ඉදිරිපත් කිරීමට නියෝග කර ඇති අතර, කඩුවෙල ගරු මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුව 2022.07.05 වන දින නැවත කැඳවීමට නියමිතය.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය,**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**